# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# අධ්‍යයන / අනධ්‍යයන පුරප්පාඩු

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අධ්‍යයන/අනධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2024.05.27** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යයන පුරප්පාඩු**

බෞද්ධ අධ්‍යයන පීඨය

## 01. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, II/I ශ්‍රේණිය තනතුරු

i. සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන

## 02. කථිකාචාර්ය (තාවකාලික) තනතුරු

ii. බෞද්ධ දර්ශනය

iii. බෞද්ධ සංස්කෘතිය

iv. සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශන

v. පුරාවිද්‍යාව

**භාෂා අධ්‍යයන පීඨය**

## 03. කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, II/I ශ්‍රේණිය තනතුරු

i. සිංහල

(සිතමා අධ්‍යයනය විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම කෙරෙහි ප්‍රමුඛතාව දෙනු ලැබේ.)

ii. ඉංග්‍රීසි

(ඉංග්‍රීසි සාහිත්‍ය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ සහ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ට ප්‍රමුඛතාව ලබා දේ.)

## 04. කථිකාචාර්ය (තාවකාලික) තනතුරු

iii. පාලි

iv. සංස්කෘත

v. ඉංග්‍රීසි

vi. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම

vii. දෙමළ භාෂාව

viii. ජපන් භාෂාව

- ❖ සිංහල විෂය හැර අනෙකුත් සියලු විෂයයන් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන්ම ඉගැන්වීමේ හැකියාවක් තිබිය යුතු ය.

**සටහන:**

- ❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 17/2005 ට අනුව, අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, (**II/I** ශ්‍රේණිය) සඳහා පත් කිරීමට සලකා බලනු ඇත.
- ❖ කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, **II/I** ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගනු ලබන්නන් පළමු පත්වීම් දිනයේ සිට වසර 05ක් (පහක්) සඳහා වූ අඛණ්ඩ සේවාවක් පවත්වන බවට විශ්වවිද්‍යාලය සමග ගිවිසුමකට එළඹිය යුතු ය.

(I) **වැටුප් පරිමාණය :**

| | | | | |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) | U-AC 3(I) | - | රු. 91,310-7x2,170-106,500 | (මාසික) |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) | U-AC 3(II) | - | රු. 79,360-11x1,630-97,290 | (මාසික) |
| කථිකාචාර්ය (ස්ථිර නොකළ) | U-AC 3(III) | - | රු. 69,580-5x1,630-77,730 | (මාසික) |
| කථිකාචාර්ය (ආධුනික) | U-AC 3(IV) | - | රු. 54,600-10x1,335-67,950 | (මාසික) |

(II) **අධ්‍යයන දීමනාව :**

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) | - | මූලික වැටුපෙන් 189% |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) | - | මූලික වැටුපෙන් 189% |
| කථිකාචාර්ය (ස්ථිර නොකළ) | - | මූලික වැටුපෙන් 164% |
| කථිකාචාර්ය (ආධුනික) | - | මූලික වැටුපෙන් 144% |

- ❖ ස්ථිර අධ්‍යයන තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛානුකූලව හිමි අනෙකුත් දීමනා සඳහා හිමිකම් ඇත.

**කථිකාචාර්ය (තාවකාලික) - රු. 49,860/- (මාසික)**

**අනධ්‍යයන පුරප්පාඩු**

## 05. කළමනාකරණ සහකාර (සරප්) III ශ්‍රේණිය තනතුර

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථයන් සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.

   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව

   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය

   iii. ගණිතය

**සහ**

2. අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරක දී විෂයයන් තුන ම (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබිය යුතුය. **ඉන් එක් විෂයක් ගණකාධිකරණය විය යුතුය.**

පහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(a) පිළිගත් ආයතනයකින් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක් සඳහා පරිගණක යෙදුම් සම්බන්ධයෙන් ලබා ගන්නා ලද පිළිගත හැකි සුදුසුකමක්.

**සහ**

(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද.

**තේරීම** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වැටුප් ක්‍රමය** : U-MN 1 (III)

**වැටුප් පරිමාණය** : 30,725-17×300-35,825 (මාසික)

**සටහන** :

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

iii. යහපත් චරිතයකින් හෙබි විය යුතු ය.

iv. තෝරා ගනු ලබන අය විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් තැබිය යුතු ය. **2018.10.17 දිනැතිව නිකුත් කරන ලද අංක 12/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ** කොන්දේසි තවදුරටත් අදාළ වේ.

**ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ (අධ්‍යයන හා අනධ්‍යයන තනතුරු සඳහා)**

- ❖ තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10%ක හා සේවා යෝජකයා විසින් 15%ක මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3%ක මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.
- ❖ පාරිතෝෂික දීමනාව

**අනෙකුත් ප්‍රතිලාභ (අධ්‍යයන හා අනධ්‍යයන තනතුරු සඳහා)**

- ❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව හිමි අනෙකුත් දීමනා
- ❖ විශ්වවිද්‍යාලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට දායක කරගනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරුවන් තනතුරට අදාළ **සුදුසුකම් දක්වා ඇති තොරතුරු පත්‍රිකා සහ අයදුම්පත් 2024.05.20 දින** දක්වා මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී (පාලන) කාර්යාලයට පෞද්ගලිකව පැමිණීමෙන් හෝ තම තම, ලිපිනය ලියූ මුද්දර ගැසූ (රු. 120.00) ලිපි කවරයක් (සෙ.මී 23X10 ප්‍රමාණයේ) මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී (පාලන) වෙත එවීමෙන් (කවරයේ ඉහළ වම් කෙළවරෙහි අදාළ තනතුර සඳහන් කළ යුතුය) නැතහොත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත (download) කළ හැකි ය.

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග සුදුසුකම් දක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායාපිටපත් ද සහිතව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කර **2024.05.27** දින හෝ ඊට පෙර **"සහකාර ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම."** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිකයන් විසින් එවනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතුය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ලේඛකාධිකාරී (වැඩ බලන)**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 37, මොරගහහේන පාර,**
**පිටිපන නගරය, හෝමාගම.**

2024.04.26.